**කැලණිය විශ්වවිද්‍යාලය - 2022**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

**කැලණිය විශ්වවිද්‍යාලයේ** 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලධාරින් 22 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.2,021,205 ක් වූ ණය මුදලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන නොතිබුණි. | මෙම ණය ලබාගත් පුද්ගලයින්ගේ අර්ථසාධක අරමුදල් සහ විශ්‍රාම අරමුදල් ඉදිරි වර්ෂවලදී නිදහස් කිරීමේදී අදාළ අයවිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව. | නොපමාව අයකර ගැනීම් සිදුකර ගත යුතුය. |

### 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවිධ ණය හිමියන් යටතේ දක්වා තිබුණු 2019 ජනවාරි සිට 2022 ජුනි දක්වා කාලයට අදාළ එකතු වටිනාකම රු.5,837,960 ක් වූ අවලංගු කළ චෙක්පත් 359 ක් වෙනුවෙන් ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022.12.31 දිනට අවලංගු කළ යුතු චෙක්පත් 2023 වර්ෂය තුළ නිවැරදි කරන බව. | ප්‍රමාදයන්ගෙන් තොරව නිරවුල් කිරීම් සිදුකළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>(i) මුදල් රෙගුලාසි 371 | 2015 – 2022 කාලය තුල විශ්වවිද්‍යාලය විවිධ කාර්යයන් සඳහා අවස්ථා 89 කදී ලබා දී තිබුණු එකතු වටිනාකම රු.6,875,758 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | අයකර ගැනීම් හා අවශ්‍ය නිරවුල් කිරීම් සිදුකරන බව. | නොපමාව නිරවුල් කිරීම් කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 571 | වසර 02 කට වැඩි කාලයක සිට පවතින එකතු වටිනාකම රු.31,150,036 ක් වූ ටෙන්ඩර් තැන්පතු හා ආරක්ෂක තැන්පතු ද වසර 05 කට වැඩි කාලයක සිට පවතින පුස්තකාල තැන්පතු රු.6,059,000 ක් සම්බන්ධයෙන් ද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වර්ෂ 2 ඉක්මවූ තැන්පතු ආදායමට ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2021 ජූලි 28 දිනැති අංක 01/2021 දරන ජාතික අයවැය | වියදම් සීමා කරන ලෙස චක්‍රලේඛ මගින් උපදෙස් ලබාදී තිබියදී | වාර්ෂිකව බඳවා ගැනෙන සිසුන් සංඛ්‍යාව ක්‍රමිකව වැඩිවන විට ඔවුන්ට අවශ්‍ය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| චක්‍රලේඛයෙහි 2.3 (අ) ii | සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.154,884,302 ක ස්ථාවර වත්කම් මිලදීගෙන තිබුණි. | පහසුකම් විශ්වවිද්‍යාලය මගින් සැපයිය යුතුව පවතින බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,612,869,460 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,343,859,893 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,269,009,567ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන ආදායම්, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන අංශයේ ආදායම් හා අභ්‍යන්තර ආදායම්වල වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 අනුපාත විශ්ලේෂණය**

(i) යෙදූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය
2021 වර්ෂයේදී ස්කන්ධ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය සියයට 11.8 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය සියයට 15.6 ක් විය. එය 2021 වර්ෂයට සාපේක්ෂව වර්ධනයකි.

(ii) ජංගම වත්කම් අනුපාතය
ජංගම වත්කම් වලට ජංගම වගකීම් අනුපාතය 2:1 ක් ලෙස අවම වශයෙන් පැවතිය යුතු අතර සමාලෝචිත වර්ෂයේදී එය 3.9:1 ක් ලෙස පැවති අතර 2021 වර්ෂයේදී එම අනුපාතය 2.65:1 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.15,302,360 ක් වූ අයිතම් 5 ක් ගබඩා ලෙජරයේ වාර්තා කර නොතිබීමත් වාර්ෂික තොග සමීක්ෂණයේදී එකතු වටිනාකම රු.259,194 ක් වූ අයිතම වර්ග 47 ක් අතිරික්ත තොග ලෙසත් එකතු වටිනාකම රු.746,444 ක් වූ අයිතම 22 ක් ඌණ තොග ලෙසත්, හඳුනාගෙන තිබීම හේතුවෙන් ගබඩා පාලනය සම්බන්ධ අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පැවතුණි. | වාර්ෂික තොග සමීක්ෂණයේදී ගබඩාව වසා තිබුණු කාලය තුළ ලද අයිතම 2023 ජනවාරි මාසයේදී තොග ලෙජරයට වාර්තා කර ඇති බවත් අතිරික්ත තොගය ගබඩා තොගයට ඇතුලත් කරන බවත් , ඌන හා අතිරික්ත තොග ඇති නොවීමට කටයුතු කරන බව. | ගබඩා පාලනය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| (ආ) | අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවීමෙන් පසුව බැඳුම්කර කඩකළ අධ්‍යයන හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ 36 දෙනෙකුගෙන් එකතුව රු.331,889,180 ක් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවතුණි. නිලධාරීන් 11 දෙනෙකුට අදාළව එකතුව රු.148,125,179 කින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු මුදලක් අයකර නොතිබුණි. | බැඳුම්කර මුදල් අයකර ගැනීමට නොහැකි වූ අධ්‍යයන කාර්යමණ්ඩලයට සිහිකැදවීම් ලිපි යවා ඇති බවත්, අනධ්‍යයන කාර්යමණ්ඩලයට අදාළව කම්කරු දෙපාර්තමේන්තුවෙන් අදාළ උපදෙස් ලබා ගන්නා බවත්, ඒ අනුව අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | නොපමාව අයකර ගැනීම් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බාහිර උපාධි පාඨමාලා වෙනුවෙන් 2016 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වූ සිසුන්ගේ පාඨමාලා ආරම්භ කිරීම 2019 මාර්තු දක්වාත් 2017, 2018, 2019 අධ්‍යයන වර්ෂ තුන වෙනුවෙන් 2022 ජූනි දක්වාත් ප්‍රමාද වී තිබුණි. අධ්‍යයන වර්ෂ සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය ප්‍රමාදවීම, නියමිත කාලයට විභාග පැවැත්වීමට නොහැකිවීම හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට වැඩි කාලයක් ගතවීම ආදී කරුණු නිසා බාහිර උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීමට ලියාපදිංචි සිසුන්ට වැඩි කාලයක් ගත වී තිබුණි. | 2012/2013 අධ්‍යයන වර්ෂයේදී බාහිර උපාධි පාඨමාලා සඳහා සිසුන් 27,700 ක් පමණ පිරිසක් සුදුසුකම් ලැබ ඉල්ලුම් කර තිබීම නිසා විශ්වවිද්‍යාලයට කළමනාකරණය කිරීම අපහසු වූ බැවින් එම ශිෂ්‍යයින් හට ප්‍රාදේශීය වශයෙන් සම්මන්ත්‍රණ පැවැත්වීම සහ අධ්‍යයන සහාය ලබාදීම සිදුකරන ලද බව. මේ හේතුවෙන් ශිෂ්‍ය ලියාපදිංචිය 2014, 2015 හා 2016 අධ්‍යයන වර්ෂවලදී ප්‍රමාද වූ බවත් 2017, 2018, 2019 අධ්‍යයන වර්ෂ සඳහා සිසුන් ලියාදිංචි කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ උපදෙස් අනුව නවතා තිබූ බව. | අනවශ්‍ය ප්‍රමාදයන් වලක්වා ගනිමින් සිසුන් බඳවා ගැනීමට හා නියමිත පරිදි විභාග පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීමට ක්‍රියාකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.6,472,850 ක් භාවිතා කර පර්යේෂණ කාර්යයන් 22ක් සිදුකිරීමට අපේක්ෂා කර තිබුණු නමුත් පර්යේෂණ කාර්යයන් 4ක් සඳහා රු.390,025 ක් පමණක් වැයකර තිබුණි. | පර්යේෂණ කාර්යයන් 16 සඳහා මුදල් ඉල්ලීම් සිදුකර නොමැති බවත්, පරිගණක පීඨය සඳහා අනුමත පර්යේෂණ කාර්යයන් 6 ක් සඳහා ගිවිසුම් අත්සන් කර නොමැති බව. | පර්යේෂණ කාර්යයන් සඳහා ප්‍රතිපාදනය කර ඇති මුදල් උපරිමයෙන් උපයෝජනය කළ යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශිෂ්‍යත්ව හා ත්‍යාග මුදල් ආයෝජනය මත සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු. 3,691,428ක් වූ පොලී ආදායමින් රු. 402,986 ක් පමණක් අදාළ අරමුණු වෙනුවෙන් වැයකර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.14,575,335 ක් වූ පොලී ආදායමක් අදාළ අරමුණ වෙනුවෙන් වැයකර නොතිබුණි. | විද්‍යාර්ථයින්ට ප්‍රතිලාභ වැඩියෙන් ලබාදීමට අදාළව නිර්නායක වෙනස් කිරීමට කටයුතු කරන බව. | විද්‍යාර්ථයින්ට ප්‍රතිලාභ ලබාගත හැකි පරිදි ශිෂ්‍යත්ව හා ත්‍යාග මුදල් අරමුදල්හි අරමුණු කාලීනව සමාලෝචනය කර අදාළ මුදල් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාණිජ්‍ය හා කළමනාකරණ පීඨයට මහල් 10 කින් යුතු පීඨ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා උපදේශන සේවා සපයන ආයතනය වෙනුවෙන් 2020 හා 2021 වර්ෂ වලදී | ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022 හා 4/2022 අනුව රජයේ ඉදිකිරීම් කටයුතු නවතා දමන ලෙස උපදෙස් ලබාදී ඇති බැවින් අදාළ කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් | රජයේ මුදල් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එකතුව රු.15,013,437 ක් උපදේශන සේවා ගාස්තු ලෙස ගෙවා තිබුණු නමුත් අදාළ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2022 දෙසැම්බර් 31 දින දක්වාම ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු නවතා ඇති බව. | |
| (ආ) | 2020 අගෝස්තු 10 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු මහල් 4 කින් යුතු හෙට්ටියාවත්ත පඤ්ඤාරාම නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අධ්‍යාපන අමාත්‍යංශයේ අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන) ගේ 2021 ජූනි 21 දිනැති ලිපියේ උපදෙස් පරිදි දෙපාර්ශවයේ එකඟතාවය මත අතරමග ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රු.4,029,430 ක් අමතරව ගෙවීමට සිදු වී තිබුණි. තවද අදාල කොන්ත්‍රාත්තුව වෙනුවෙන් වැඩ අත්තිකාරම් ලෙස රු.32,698,197 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. | මහල් 4 කින් යුතු හෙට්ටියාවත්ත පඤ්ඤාරාම නේවාසිකාගාර ගොඩනැගිල්ලේ වැඩ සඳහා කොන්ත්‍රාත් ගිවිසුම අනුව ගෙවීම් කරන බව. | රජයේ මුදල් ඵලදායී ලෙස කළමනාකරණය කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ අංශ 22 ක් සඳහා හදිසි අවශ්‍යතාවයන් ලෙසට දක්වමින් මිලදී ගත් වටිනාකම රු.4,726,000 ක් වූ බහු ප්‍රක්ෂේපන යන්ත්‍ර 34 ක් 2022 අප්‍රේල් 21 දින ගබඩාවට ලැබී තිබුණි. ගබඩාවට ලැබී මාස 2කට වැඩි කාලයකින් පසු එනම් 2022 ජූලි 05 දින සිට නොවැම්බර් 24 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ඉන් යන්ත්‍ර 28 ක් පමණක් බෙදාදී තිබුණි. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් වූ සියළුම ඉල්ලීම් සළකාබලා මිලදී ගැනීමට කටයුතු කළ බව. | මිලදීගත් භාණ්ඩ උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යයන පීඨ 6 සඳහා අනුමත ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය 814 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 679 ක් විය. ඉන් 135 දෙනකු සප්ත වාර්ෂික නිවාඩු හා අධ්‍යයන නිවාඩු ලබා ගැනීම නිසා විශ්වවිද්‍යාලයේ 14,532 ක් වූ ශිෂ්‍යයන්ට සක්‍රිය ලෙස අධ්‍යයන කටයුතු සිදු කිරීමට හා විෂය නිර්දේශ ආවරණය කිරීමට බාහිර දේශකයින්ගේ සහාය ලබා ගෙන තිබූ අතර 2022 වර්ෂය තුලදී පමණක් බාහිර දේශක ගාස්තු ලෙස රු.28,103,205 ක් ගෙවා තිබුණි. එය 2021 වර්ෂයට සාපේක්ෂව සියයට 56 ක වැඩිවීමක් විය. | මේ වනවිට සියලුම පීඨ සඳහා පුවත්පත් දැන්වීම් ඵලකර අයදුම්පත් කැඳවා අවසන් කර ඇති නමුත් දැනට නව බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇති බැවින් අනුමැතිය ලද විගස පත්වීම් ලිපි නිකුත් කිරීමට කටයුතු කරන බව. | අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් උපරිම දායකත්වයක් ලබාගෙන විද්‍යාර්ථයින්ට අවශ්‍ය දැනුම ලබා දීමට කටයුතු කළ යුතුය. |